**ධීවර ත්‍යාග අරමුදල - 2019**

---------------------------------

## 1.1 මතය ප්‍රකාශ කිරීම

-----------------

ධීවර ත්‍යාග අරමුදලේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 15 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවසහ2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ප්‍රකාශ කිරීම සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ප්‍රකාශ කිරීම සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමටප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙසසැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ධීවර කාර්යාල 03 ක් විසින් නිම වූ නඩු 05 කට අදාලව විකුණන ලද නඩු භාණ්ඩවල වටිනාකම රු. 308,915 ක් අරමුදලේ ආදායම ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | දිස්ත්‍රික් ධීවර කාර්යාලවලින් එවැනි මුදලක් 2019 වර්ෂය තුල අරමුදලට බැර කර තිබුණේ නැත. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට පියවර ගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජසන්තක භාණ්ඩ විකිණීමෙන් 2019 වර්ෂය තුළ ලැබූ රු.9,607,333 ක මුදලින් ත්‍යාග දීමනා ලෙස හා ඒකාබද්ධ අරමුදලට රු.5,870,700 ක් ගෙවා තිබූ අතර, ඉතිරි රු. 3,736,633ක මුදල ගෙවිය යුතු ලෙස මූල්‍යප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2019 වර්ෂය තුළ කමිටු තීරණ වලට අනුව ගෙවීමට ඉදිරිපත් කර ඇති නඩුවලට අදාළ මුදල් පමණක් ගෙවීමට කටයුතු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. | ගෙවිය යුතු මුළු මුදල මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළ යුතුවීම. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | රාජන්තක භාණ්ඩ විකිණීමෙන් 2019 වර්ෂය තුළ ලැබූ මුදල රු.9,607,333 ක් වුවද කාර්යසාධන වාර්තාව අනුව 2019 වර්ෂය තුළ ලැබූ මුදල රු.6,148,395 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් රු.3,458,938 ක වෙනස පිළිබඳව හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,973,908 ක ශේෂය පිළිබඳව අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයන්වල නිවැරදිතාවය තහවුරු වී නොතිබුණි. | 5,432,846 | ධීවර කාර්යාල විසින් බැර කරන ලද ආදායම් විස්තර | වෙනස පිළිබඳව පිළිතුරු සපයා නැත. අධිකරණවලින් එම මුදල් ආපසු ගෙවීමට විශාල කාලයක් ගැනීම මෙයට හේතු වී ඇත. | නිම වූ නඩුවලට අදාලව අධිකරණවලින් ලැබිය යුතු මුදල් පිළිබඳ තහවුරුකිරීම් ලබාගැනීමෙන් ආදායම නිවැරදිව හඳුනා ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) | 2019 වර්ෂයේදී රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ත්‍යාගලාභීන්ට හා ඒකාබද්ධ අරමුදලට රු.5,870,700 ක් ගෙවා තිබුණි. වැටලීමට සහභාගි වූ නිලධාරීන් සම්බන්ධයෙන් නියමිත පරිදි තොරතුරු පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් හිමිකම් නොමැති අයට ගෙවීමක් සිදු වී ඇත්ද, ලැබිය යුතු රාජ්‍ය ආදායම අහිමි | 5,870,700 | වැටලීම් හා නඩු කටයුතුවලට සම්බන්ධ වුවන්ගේ නාම ලේඛන | වසරක් තුල නඩු 10 ක් පමණ සුළු වවුචර් ප්‍රමාණයක් ඉදිරිපත් වන බැවින් වෙනම ලේඛනයක් පවත්වා නොයයි. | වැටලීම් හා නඩුවලට සම්බන්ධ වුවන්ගේ තොරතුරු ඇතුළත් ලේඛන පවත්වා ගත යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වීමක් සිදු වී ඇත්ද යන්න තහවුරු කරගත නොහැකි විය. | | | | |
| (ඈ) | තොරතුරු සපයන්නන් සඳහා ගෙවීමට රු.425,683 ක් අධ්‍යක්ෂ ජනරාල් වරයාට ගෙවා තිබුණ ද අදාල පාර්ශවයන් වෙත එම ගෙවීම කරනු ලැබුවේ ද යන්න විගණනයේ දී තහවුරු නොවීය. | 425,683 | තොරතුරු සපයන්නන්ගේ හා වැටලීම්වලට සහභාගි වුවන්ගේ ලේඛන | තොරතුරුසපයන්නෙකු ට එම මුදල ලබාදීමට අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙන ලදී. | විනිවිදභාවයකින් යුතුව තොරතුරු පවත්වා ගත යුතු වීම. |
| (ඈ) | වර්තමානයේ කොපමණ නඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක වන්නේ ද, කොපමණ නඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක නොවන මට්ටමේ පවතින්නේ ද යන්න නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි විධිමත්ව යාවත්කාලීන කරන ලද වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | - | විධිමත්ව යාවත්කාලීන කරන ලද වාර්තා | ඉදිරියේ දී නිවැරදිව වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නඩු සම්බන්ධ සියලු තොරතුරු හා යාවත්කාලීන කළ වාර්තා පවත්වා ගත යුතු වීම. |
| (ඉ) | දිස්ත්‍රික් ධීවර කාර්යාල 13 ක් විසින් අත්අඩංගුවට ගත් භාණ්ඩ හා උපකරණ පිළිබඳව හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි | - | යන්ත්‍ර උපකරණ පිළිබඳ ලැයිස්තු | දිස්ත්‍රික් ධීවර කාර්යාල භාරයේ පවත්නා භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණ දත්‍රිකුණාමල දිස්ත්‍රක් කාර්යාලය පමණක් දැනුම් දී තිබුණි. | අරමුදල සතු සියලු වත්කම් හඳුනා ගැනීමට අවශ්‍ය ගිණුම් ප්‍රතිපත්ති සකස් කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට ලැබිය යුතු මසුන් අලෙවි ආදායම රු.1,973,908 ක් අයකර ගැනීමටකටයුතු කර නොතිබුණි. | අධිකරණවලින් මෙම මුදල් ලබාගැනීමට විශාල කාලයක් ගතවීම මෙයට හේතු වී ඇත. | අධිකරණවලින් ලැබිය යුතු ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**1.7 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත | | | |
| (i) 46(4) වගන්තිය | වගන්තිය ප්‍රකාරව මසුන් හෝ වෙනත් ජලජ සම්පත් විකිණීමෙන් ලැබෙන මුදල් අදාල මහේස්ත්‍රාත් අධිකරණයෙහි තැන්පත් කරනු ලැබිය යුතු වුවත් විමර්ශන අංශය මෙහෙයවන ලද නඩුවට අදාලව සිදුකරන ලද වෙන්දේසියෙන් ලද රු.5,028,600 ක මුදල මහේස්ත්‍රාත් අධිකරණයේ තැන්පත් කරනු වෙනුවට එදිනම ධීවර දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට බැරකර තිබුණි. | මේ පිළිබඳ දැනුම්දීමට සටහන් කර ගතිමි. | වෙන්දේසිය මගින් ලැබෙන මුදල් අධිකරණයේ තැන්පත් කළ යුතු වීම. |
| (ii) 49(5) වන වගන්තිය | • නීති විරෝධි කටයුතුවල යෙදුණු අයට විරුද්ධව පැවරුණු නඩු පිළිබඳ වාර්තා ලබා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | නිරන්තරයෙන් මාසික රැස්වීම් වල දී සහකාර අධ්‍යක්ෂවරුන් දැනුවත් කරනු ලැබේ. | අදාල නඩු වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |
| | • වැටලීම් වලට සහභාගිවූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළයුතු වුවත් 2014, 2015, 2016, 2017, 2018, 2019 වර්ෂවලදී පිළිවෙලින් වැටලීම් 271ක්, 348 ක් ,488 ක්,427 ක්, 327 ක් හා 604 ක් සඳහා නඩු පැවරීම් සිදුකර තිබුණ ද 2014, 2017, 2018 වර්ෂවල කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණි. | ත්‍යාගලාභීන් වවුචර් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම මෙයට හේතු වී ඇත. | වැටලීම්වලට සහභාගී වු නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළ යුතු වීම. |
| (iii) 59(2) වගන්තිය | ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ගැනීමට සටහන් කර ගතිමි. | ත්‍යාග අරමුදලේ කාර්යය භාරයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | 2017,2018,2019 වර්ෂවල පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සැලසුම් පිළියෙල කර නොතිබුණි. | | අවශ්‍ය සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (iv) | 59 (3) වගන්තිය හා 51 (4) උපවගන්තිය | අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ත්‍යාග අරමුදලට බැරවිය යුතු මෙතෙක් බැර වී නොමැති ආදායම් හා අත්අඩංගුවට ගෙන අධිකරණය / නාවික හමුදාව හා දිස්ත්‍රික් ධීවර කාර්යාලවල පවතින භාණ්ඩ පිළිබඳ තොරතුරු 2020 ජනවාරි 4 දිනට පෙර ලැබෙන ලෙස ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් පියවර ගතයුතු බව සඳහන්ව ඇතත් එය නිසි පරිදි ක්‍රියාත්මක වී නොතිබූ අතර පසුවිපරම් කටයුතු ද සිදුකර නොතිබුණි. | ඉදිරියේ දී මෙම තොරතුරු මාසිකව ගෙන්වා ගැනීමට කටයුතු කරමි. | ත්‍යාග අරමුදලට බැර විය යුතු ආදායම, දිස්ත්‍රික් ධීවර කාර්යාල භාරයේ පවතින භාණ්ඩ පිළිබඳ තොරතුරු පවත්වා ගත යුතු වීම. |
| (v) | 59 (4) වගන්තිය | පනත ප්‍රකාරව නිලධාරීන්ට හා තොරතුරු සපයන්නන්හට කලින් කලට සුදුසු යැයි අධ්‍යක්ෂවරයා සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ත්‍යාග මුදල් ලෙස ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | වැටලීම් කරන නිලධාරීන් හා තොරතුරු සපයන්නන් දිරිමත් කිරීම සඳහා ත්‍යාග මුදල් ලබාදීමේ ක්‍රමවේද සකස් කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 133 (i) හා 2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ජී/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ත්‍යාග අරමුදල සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 156(5) | රෙගුලාසියෙන් බැහැරව ධීවර ත්‍යාග අරමුදල් ගිණුම, ලැබිය යුතු මසුන් අලෙවි ආදායම් ගිණුම් යන ගිණුම්වල ගනුදෙනු සටහන් කපා හැර තිබූ අතර, එම කපාහැරීම් වගකිව යුතු නිලධාරියෙකු විසින් පරීක්ෂාකර කෙටිසන් තබා තහවුරු කර නොතිබුණි. තවද වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් උපයෝගී කර නොගෙන හා වගකිව යුතු නිලධාරියකුගේ පරීක්ෂාවකින් තොරව ලෙජරයේ සටහන් කර තිබුණි. | පිළිතුරු සපයා නැත. | වෙනස් කිරීම, කපාහැරීම් වගකිව යුතු නිලධාරියෙකු කෙටිසන් තබා සහතික කළ යුතු වීම. |
| (ඇ) | 2019 මාර්තු 5 දිනැති අංක DFAR/INF/ධීවර ත්‍යාග අරමුදල දරන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය | වැටලීම් ආරම්භ කිරීමේ දී ලොග් සටහනෙහි ඇතුලත් කර එහි පිටපතක් ගොනු කළයුතු අතර එම වැටලීම් සඳහා සහභාගි වන සියලු නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් විය යුතුය. එසේ වුවත් NB 1391 දරන වාහනය යොදාගෙන විමර්ශන අංශය 2019 ජූලි 02 දින සිදුකළ වැටලීම සම්බන්ධයෙන් එවැනි තොරතුරු අඩංගු කර ලොග් සටහන් යොදා නොතිබූ බවත් හා එහි පිටපතක් ගොනුකර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නැත. | වැටලීම්වලට සහභාගීවන්නන් ගේ නම් ඇතුළත් කර ලොග් සටහන් පවත්වාගෙන යා යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,986,600 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.610,145 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,376,455 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී වැටලීම් කළ නිලධාරීන්ට දීමනා රු.4,547,647 ක් ගෙවා තිබුණද, රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම රු.8,924,103කින් වැඩි වීම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුලතිව් දිස්ත්‍රික් ධීවර කාර්යාලය විසින් 2018 වර්ෂයේ පවරා තිබූ නඩු ප්‍රමාණය 70 ක් වූ අතර 2018 වර්ෂය අවසන්වනවිටත් නොවිසඳී තිබූ නඩු ප්‍රමාණය 58 ක් හා 2019 ජනවාරි මාසය තුල පමණක් පවරා තිබූ නඩු සංඛ්‍යාව 8 ක් විය. තහනම් දැල් හා ඩයිනමයිඩ් භාවිතය මෙම නඩු පැවරීම සඳහා හේතු වී තිබූ අතර මෙම ධීවරයින් නිසා මත්ස්‍ය සම්පත විනාශවීමේ තර්ජනයකට මුහුණ පා තිබීම සම්බන්ධයෙන් කළමනාකරණය ධීවරයින් දැනුවත්කර තිබුණද නීති විරෝධි කාර්යයන් අඩුවී නොතිබුණි. පසුවිපරම් කටයුතු පුළුල් කර වඩා කාර්යක්ෂම ක්‍රමවේදයන් හා ප්‍රචාරණ කටයුතු වලින් වඩා ඵලදායි ප්‍රතිඵල ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. | එකඟ නොවෙමි. වර්ෂය තුල නීති විරෝධි ධීවර කටයුතු සම්බන්ධයෙන් සෑම දිස්ත්‍රික්කයකම ධීවරයින් දැනුවත් කිරීම් වැඩමුළු පවත්වා ඇත. | මත්ස්‍ය සම්පත් රැකගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේද සකස් කිරීමකළ යුතු වීම. |
| (ආ) | නිමවූ නඩුවලට අදාලව උසාවිවල තැන්පත් කරන ලද මුදල් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම දුර්වලතා මඟ හරවා ගන්නා ලෙසට අදාල නිලධාරින්ට උපදෙස් දීමට සටහන්කර ගතිමි. | නඩු පිළිබඳ වාර්තා විධිමත්ව පවත්වාගෙන යාමටත් මුදල් ගෙන්වා ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2019 ජූලි මස රාජසන්තක කරන ලද මුහුදු කුඩැල්ලන් පෞද්ගලික ස්ථානයක වෙන්දේසිය පැවැත්වීමට කමිටුව විසින් පුවත්පත් දැන්වීම් පළකර තිබුණි. එසේ වුවද වෙන්දේසිය පවත්වන ස්ථානය පිළිබඳව පැවති මත ගැටුම හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ පැවැත්වීම සඳහා තීරණය ගැනීම හේතුවෙන් අවස්ථා 2 කදී දැන්වීම් සඳහා රු.116,860 ක් වැයකර තිබුණි. | දෙපාර්තමේන්තුවේ ගබඩා පහසුකම් නොමැති නිසා පෞද්ගලික ආයතනයකරඳවා තිබුණුබැවින් ඔවුන් අකමැති වීම නිසා ප්‍රධාන කාර්යාලයේ වෙන්දේසිය පැවැත්වීමට සිදුවීම නිසා දෙපාරක් පල කිරීමට සිදුවී ඇත. | කළමනාකරණය විසින් ඵලදායී තීරණයන් ගැනීමට ක්‍රියාකළ යුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අපේක්ෂිතවැටලීම්ඉලක්කය 655 ක් වුවත් වැටලීම් 200 ක් පමණක් එනම් සියයට 31 ක ප්‍රමාණයක් පමණක් සිදුකර තිබුණි. මේ නිසා යාපනය හා පුත්තලම දිස්ත්‍රික් ධීවර කාර්යාල හැරුණු විට අනෙකුත් දිස්ත්‍රික් ධීවර කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ විමර්ශන අංශය අදාල ඉලක්ක කරා ළඟා වී නොතිබුණි. | මෙම ඉලක්කය තීරණය කිරීමේ දී අධි ගණනය කිරීමක් සිදුවී ඇති බව පෙනේ. | කළමනාකරණය සැලසුම් ප්‍රකාරව ඉලක්ක ළඟාකර ගැනීමට ක්‍රියාකළ යුතු වේ. |